# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/31 - 2022 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතුකොට ගෙන ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ, අංක 09, විලේගොඩ කොට්ඨාසයට තේරී පත්වූ මොරගල් පේඩිගේ තිලක් රෝහන ජයවික්‍රම අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාලපරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ, අංක 09, විලේගොඩ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා හපන්තිලගේ තිලකරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සුරංග අඹහතැන්නෙ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, හපන්තිලගේ තිලකරත්න, ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ, අංක 09, විලේගොඩ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරි,
ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 10 - 0030

1A - G 37700 — 26 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ බදුල්ල මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන බදුල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ බදුල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ මුදියන්සේලාගේ අයිරාංගනී අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම බදුල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුභසිංහ මුදියන්සේලාගේ අජන්තා කුමාරිහාමි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බදුල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි කා. කාන්දීපන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සුභසිංහ මුදියන්සේලාගේ අජන්තා කුමාරිහාමි, බදුල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කා. කාන්දීපන්,**
තේරීම්භාර නිලධාරි,
බදුල්ල මහ නගර සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

EOG 10 - 0031

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.